# 1982 – කෘෂිකර්ම සංගණනය

## වතු ලැයිස්තු සකස් කිරීම සම්බන්ධව උපදෙස්

1. හැඳින්වීම

කෘෂිකාර්මික ව්‍යුහයට අදාල සංඛ්‍යාන දත්ත සපයා ගැනීම සඳහා කෘෂිකර්ම සංගණනයක් පැවැත්වීමට අරමුණු කර ඇත. එබඳු සංගණනයකදී "ගොවි කාණ්ඩය" තොරතුරු රැස් කිරීමේ ඒකකය වේ. පසුගිය සෑම කෘෂිකර්ම සංගණනයකදී මෙන්ම ගොවි කාණ්ඩ වැවිලි හෝ වතු අංශය සහ කුඩා ගොවි කාණ්ඩ අංශය වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදා ඇත.

2. "වත්ත" අර්ථ නිරූපනය

එකම කළමනාකරණ ඒකකයක් යටතේ වන අවම වශයෙන් භූමි ප්‍රමාණය අක්කර 20 කට සමාන හෝ ඊට වැඩි එක් බිම් කැබැල්ලක්වත් ඇති ගොවි කාණ්ඩය වත්තක් ලෙස සලකනු ලැබේ. මෙම වතු ප්‍රධාන කොටස් දෙකකට බෙදනු ඇත.

ඒ කොටස: භූමි ප්‍රමාණය අක්කර 20 කට සමාන හෝ ඊට වැඩි සහ නේවාසික කම්කරුවන් 10 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් සිටින

බී කොටස: භූමි ප්‍රමාණය අක්කර 20 කට සමාන හෝ ඊට වැඩි සහ නේවාසික කම්කරුවන් නොමැති හෝ 10 කට අඩු ප්‍රමාණයක් සිටින

සටහන: 1 භූමි ප්‍රමාණය අක්කර 20 කට සමාන හෝ ඊට වැඩිවූ බිම් කැබැල්ල වී ගොවිතැනට හෝ හේන් ගොවිතැනට යොදා ගන්නා අවස්ථා වලදී එකම කළමනාකරන ඒකකයක් යටතේ පැවතිය නොහැකි නිසා එය වත්තක් නොවේ.

11 කුඹුරු හා ගොඩ ඉඩම් ද එක්ව ඇති අක්කර 20 කට සමාන හෝ ඊට වැඩි බිම් කැබැල්ලක් ගොඩ ඉඩම් ප්‍රමාණය අක්කර 20 කට අඩුව පවතින අවස්ථාවේදී වැඩි බිම් ප්‍රමාණයක් ගොඩ ඉඩම් වන්නේ නම් පමණක් වත්තක් ලෙස සැලකේ.

111 භූමි ප්‍රමාණය අක්කර 20 කට සමාන හෝ ඊට වැඩි වූ බිම් කැබැල්ලකින් යුක්තව එම කළමනාකාර ඒකයයටම අයත් වන කුඹුරු හෝ වෙනත් බිම් කැබලි වෙතොත් ඒවා වත්තෙහි කොටස් ලෙස සැලකිය යුතුය.

1V ගොවි කාණ්ඩයකට අයත් වන බිම් කැබලි කීපයක භූමි ප්‍රමාණයන්ගේ එකතුව අක්කර 20 කට සමාන හෝ ඊට වැඩි වුවද එය වත්තක් නොවනු ඇත.

3. බිම් කැබැල්ල

බිම් කැබැල්ල යනු වෙනත් ගොවි කාණ්ඩයකට අයත් වූ බිමකින්, ජල මාර්ගයකින්, කැලෑවකින් හෝ පාරකින් මායිම් වී ඇති බිම් කොටසකි. එක් ගොවි කාණ්ඩයක බිම් කැබලි දෙකක් කිසි විටෙකවත් එකිනෙකට යාව පිහිටන්නේ නැත.

ඉඩමක ස්වභාවය අනුව හෝ වගා කරනු ලබන බෝග වර්ගය අනුව හෝ බිම් කැබැල්ලක් වෙන් කර දැක්විය නොහැකියි. එකම ගොවි කාණ්ඩයකට ගොඩ ඉඩමක්ද, අස්වැද්දන ලද කුඹුරු ඉඩමක්ද යාව පිහිටියේ නම් ඒ දෙකම එකම කැබැල්ලක් සේ සලකන්න.

විශාල ප්‍රමාණයකින් යුක් වත්තක, මැදින් දිවෙන, වත්තට අයත් පාරවල් මෙන් පොදු පාරවල් ද